නන්දනත් ආනන්දත් එකම ක්ෂේත්‍රයේ රැකියාව කරන අය වූ අතර කලක පටන් ඔවුහු හොඳ මිතුරෝ ය. එදින සන්ධ්‍යාව ගත කිරීමට ආනන්ද නන්දනගේ නිවසට පැමිණියේය.

නගරයේ ඇති ඝෝෂාකාරී බවෙන් තොරවීමත් ඉතා සිහින් හඬින් ඇසෙන සරල ශාස්ත්‍රීය සංගීත රාවයත් නිසා නන්දනගේ කුටිය මානසික විඩාව සංසිඳුවන ආනන්දජනක බවකින් යුක්ත විය. මිතුරන් දෙදෙනා අඩහෝරාවක් පමණ නිහැඬියාවෙන් යුතුව මෙම භාවාත්මක සතුට වින්දනය කරද්දී නන්දනගේ බිරිඳ රැගෙන ආ රසකැවිලි හා තේ පැන් සංග්‍රහය නිසා නිහැඬියාව බිඳී ගියේය. ඉන්පසු දෙදෙනා සෞන්දර්යාත්මක කතාබහක යෙදී සිටින අතරේ නන්දන ඔහුට මෑතකදී වූ සිදුවීමක් ගැන මතකාවර්ජනයක් කළේය.

''මම අවුරුදු හය හතකට උඩදී ගියානෙ නාඩි වාක්‍ය බලන තැනකට.. නන්දන කීවේය. ''ඉතිං. ආනන්ද තව තවත් පුටුව ළං කර ගනිමින් මහත් ඕනෑකමින් එයට කන්දෙන්නට විය. ''ඉතිං මං කිව්වා සාත්තරයක් අහන්න ආවෙ කියල. ඉතිං එතැන හිටපු එක්කෙනෙක් 'පුළුවන්, මෙන්න මේ ප්‍රශ්න ටිකෙන් අහන්න කැමැති ඒවා සටහන් කරල දෙන්න රුපියල් හය දහසක් යනව.. කියල මට කොලයක් දීල ගියා ''නන්දන කියාගෙන ගියේය. .ඉතිං මොනවද ඔය කොලේ තිබුණේ?. ආනන්ද විමසීය. 'ඒකෙ තිබුණෙ මට අහන්න කියල ප්‍රශ්න ටිකක්, ඉස්සෙල්ලාම තිබුණෙ මගේ නමයි අම්මගෙ තාත්තගෙ නමුයි ඒ ප්‍රශ්නෙ අනිවාර්යයෙන් අහන්න ඕනලූ. ඊට පස්සෙ මැරෙන දිනය කරන රස්සාව අනාගත තොරතුරු එහෙම... ''ඉතිං.. ඉතිං ආයෙත් අර මනුස්සය ඇවිල්ල ඇහුව එහෙනං නාඩි වාක්‍ය බලමුද, කියල.

එහෙනම් මේකෙ බලන්න ඕන. ප්‍රශ්න ලකුණු කරල රුපියල් හයදාහකුත් එක්ක දෙන්න. කියල. තමන් උපන් දිහාව ගිය ඉස්කෝලෙ ගැන එහෙමත් ඇහුව. ගෙදර ඉඳලද ඉස්කෝලෙ ගියේ කියලත් ඇහුව. ඉතිං මං අරක පුරවල සල්ලිත් එක්ක දුන්නම කියපි ''එහෙනං හෙට දවල් දොළහට විතර එන්න මං තල්පත හොයල තියන්නං කියල මගේ උපන් දිනය අහල ලියාගත්තා. ඉතිං මං එන්න ආව. නන්දන දිගටම කියාගෙන ගිය අතර ආනන්ද එයට බාධා නොකොට සාවධානව අසා සිටියේය. 'ඉතිං පහුවැනිදා යනකොට මටත් කතා කරන්න එපායැ. අප රාදෙනේ ආනන්ද කීය. ඉතිං ඒ දවස්වල අපි දෙන්න අතරෙ මේ තරං ලොකු ෆ්‍රෙන්ඩ්ෂිප් එකක් ඇති වෙලා තිබුණේ නැහැනේ.

'හොඳම ටික දැන් අහගන්නකෝ. කියමින් නන්දන යළිත් කතාව ඇරඹුවේය. 'පස්සෙන්ද දවල් 12 කිට්ටුවෙලා මම ගියා මාව එයාගෙ කාමරයට අරගෙන තල්පත් තුනක් අරගෙන මගේ නම වසන්තද කියල ඇහුව. මම නෑ කිව්වම ඒ තල්පත පැත්තකින් තියල අනික් එක අරගෙන නම නන්දන ද කියල ඇහුව මම කිව්ව නන්දන් කියල එතකොට තාත්තා ආනන්ද පාල ද කියල ඇහුවා. අම්ම බියෙට්‍රිෂ් ද කියල ඇහුවා. මම කිව්ව අම්මට බියෙට්‍රිෂ් කියල කෑල්ලකුත් තියෙනව කියල. ඊට පස්සේ මගේ අතීත කරුණු පවුලේ විස්තර කිව්ව. හැබැයි ඒවයින් වැඩි හරියක් කලින් දවසෙ මගෙන් අහගත්ත ඒවමයි. අනික් කිව්ව ගොඩක් කරුණු වැරදියි. ඊට පස්සේ අනාගතේ ගැනත් කිව්ව. ඒව නම් තාම එක ක්වත් හරි ගිහින් නැහැ.. නන්දන කියාගෙන යන අතරේ ආනන්ද තම සටහන් පොතේ එකින් එක ලියා ගත්තේය. 'ඉතිං නන්දනට මොකක්ද මේ ගැන හිතෙන්නේ. ආනන්ද ඇසීය. 'මට හිතාගන්න බැරි කොහොමද මගේ නම අම්මගෙ තාත්තගෙ නම කිව්වේ කියන එකයි.. නන්දන කීවේය. 'අම්මගෙ තාත්තාගෙ නම හරියටම කිව්වද? ආනන්ද ඇසීය. '' මෙහෙමයි. අපේ අම්මගෙ නම භාවිත කරන්නෙ ඕක නෙමෙයි. උප්පැන්න සහතිකේ තියෙන විදියට තමයි මේ අය කිව්වේ. තාත්තගෙත් එහෙමයි. නන්දන කීවේය. ' මට නං උන හැටි හිතාගන්න පුළුවන් මං හරියටම හොයල කියන්නං.. ආනන්ද හිනාවෙමින් කීවේය.

ගවේෂණාත්මක කටයුතුවලට කැමැති ආනන්ද ඉතා ඉක්මනින් මේ ගැන සොයා දෙන බැව් කියමින් නන්දනට සමු දුන්නේය.

කැනඩාවෙහි ජීවත් වන ආනන්දගේ මිතුරෙකුගේ අයියා කෙනකු හා පුතා ලංකාවට පැමිණ සිටියේය. ඔහු හමුවූ ආනන්ද මේ දෙදෙනා සමඟ නාඩි වාක්‍ය බැලීමට ගියේය. යාළුවාගේ අයියා වන 'රෝහිත. හා ඔහුගේ විසි වියැති පුත්‍රයා 'අහිත. ස්වාධීන අය ලෙස පෙනී සිටින ලෙසටද ආනන්ද උපදෙස් දුන්නේය. අහිත ලංකාවේ ඉපිද අවුරුදු 10 ක් යනතෙක් මාතර පාසලකට ඉගෙනීමට ගොස් පසුව කැනඩාවට පදිංචියට ගිය අයෙකි. දැන් මේ දෙපළම කැනඩා ජාතිකයෝ ය. දෙදෙනාටම චතුර ලෙස සිංහල කතා කරන්නට හැකිය.

මුලින්ම ආනන්ද සමඟ කතාවට ආ නාඩි වාක්‍යකරුගේ අතවැසියා ඔහුට පෝරමයක් දී මින් ප්‍රශ්න හයක් ලකුණු කරන ලෙස කීවේය. නන්දනට මෙන් පළමු ප්‍රශ්නය ගැනීම අනිවාර්ය බැව්ද කීවේය. එහි තිබුණේ තමාගේ නම හා දෙමාපියන්ගේ නම්ය. ආනන්ද අවශ්‍ය අනෙකුත් ප්‍රශ්න ලකුණු කොට දීමෙන් අනතුරුව ආනන්ද ඉපදුණ හා පාසල් ගිය ප්‍රදේශය ගැන කතා බහක යෙදිණ. ආනන්ද සියලු විස්තර කීවේය. ඉන්පසු ආනන්දගේ උපන්දිනය අසාගෙන රුපියල් හයදාහක් ඉල්ලා ගත් ඔහු ආනන්දට හෙට උදේ 10.00 ට පැමිණෙන ලෙස කීවේය. මෙලෙසම රෝහිතට හා අහිතටද කී අතර ඔවුන් කැනඩාවේ පදිංචි බවක් නොකීමට වග බලා ගත්තේය. ඒ දෙදෙනාටද තල්පත සොයා ගැනීමට වේලාව අවශ්‍ය හෙයින් හෙට උදේ 11 ට පැමිණෙන ලෙසට දැනුම් දුන්නේය. එනවිට තමාගේ කේන්ද්‍රරයත් රැගෙන එන ලෙසට කීවේය. තිදෙනා වෙන් වෙන් වශයෙන් එතැනින් පිටත් වුණහ.

පසුදින 10.30 ට පමණ ආනන්ද ආවේය. ඒ වනවිට අහිත හා රෝහිත ද එහි පැමිණ සිටියහ. ආනන්ද ඇතුළට ගත් අතවැසියා ඔහු නාඩි වාක්‍ය බලන්නා වෙත ඉදිරිපත් කළේය. ඔහු තල්පත් හතරක් අතට ගෙන ආනන්දගේ නම විජයරත්න දැයි ඇසීය. ආනන්ද එය නොවන බව පැවසීමෙන් අනතුරුව එසේ නම් ආනන්ද දැයි ඇසීය. ආනන්ද ඔව් යැයි පැවසූ විට නාඩි වාක්‍ය කියවන්නා තල්පත දෙස බලනවාක් මෙන් පෙන්වා වෙනතක ඇති කොලයක් වෙත නෙත යොමු කරනු දැඩි විමසුම් සහගතව මෙතැන සිටි ආනන්දට තේරුම් ගියේය. ඒ කොලයේ ආනන්දගේ මවගෙ සහ පියාගේ නම්ද දෙමළෙන් ලියා තිබූ බවක් ආනන්දට යාන්තමට පෙනුණේය. තල්පත ලියා තිබුණේ වෙනත් භාෂාවකිනි. ආනන්දගේ අතීත කරුණු අතවැසියා විසින් පෙරදින අසාගත් ඒවාම විය. පෙරදින ආනන්ද කිවූ යම් අසත්‍ය කරුණු නාඩිගුරු එලෙසම කීවේය. ආනන්දගේ මවගේ හා පියාගේ නම් ද නාඩිගුරු කී විට මම ළඟදී බඳිනවා බඳින කෙනාගේ නම කියන්න පුළුවන්ද? ආනන්ද ඇසීය. දරුවා ඔයා බැන්දට පස්සෙ තමයි ඒක කියන්න පුළුවන්. නාඩිගුරු පිළිතුරු දුනි.'ඊට පස්සේ ඒක ඉබේම තල්පතේ ලියැවෙනවද? හරි පුදුම තල්පතක් ආනන්ද කී විට නාඩිගුරු සෙමෙන් සිනා විය. 'එතකොට මගේ සහෝදරයන්ගේ නම්.. ආනන්ද ඇසීය. 'ඒව ලියවිල නෑ දරුව. නාසගුරු සැර විය. මෙයා හරිම අකීකරු කෙනෙක්නේ උන් වේලාව කියද? නාඩිගුරු ඇසීය. උදේ හතයි දහයට ආනන්ද කිවේය. 'එතකොට මෙයාගෙ ලග්නය තුලාද? නාඩිගුරු ඇසීය. ආනන්ද එහෙමයි' යනුවෙන් කීය. මේ දරුවගේ කේන්ද්‍රරේ අරං බලන්න රවි ඉන්නෙ 12 හේ. එයද හරි බව ආනන්ද කීවේය. එතකොට චන්ද්‍රයා හයේ නේදැයි ඇසූ නාඩිගුරු බ්‍රහස්පති ඒ කියන්නේ ගුරු ඉන්නේ 10 යැයි කීවේ බිත්තියේ ඇති සටහනක් දෙස හොරෙන් බලමිනි. රාහු 12 කේතු 6 කියන එකත් හරි නේද කියා ඇසීය. බුධ සිකුරු දෙන්න ඉන්නෙත් රවි තියෙන කොටුව ළඟමයි. හරි පුදුමයි ඔබතුමාගේ හැකියාව හරි මහත්තය එහෙනං යන්න දෙවි පිහිටයි කියා නාඩි ගුරු කී අතර ආනන්ද එළියට එනවාත් සමග රෝහිත ඇතුළට ගියේය. ඔහුටද ආනන්දට මෙන් කේන්ද්‍රරයේ විස්තර ඔහුගේ නම දෙමාපියන්ගේ නම හරියට කීවේය. ඊළඟට ගියේ අහිතය. ඔහුට අතීත විස්තර අනාගත විස්තර කේන්ද්‍රරයේ ග්‍රහ පිහිටීම නිවැරැදිව කී නාඩි වාක්‍ය බලන්නා හරි දෙවි පිහිටයි මහත්තය යන්න යැයි කීවේය. එවිට අහිත ඔහුගේ නම දෙමාපියන්ගේ නම ඇසීය. මෙම තල්පතේ එය ලියැවී නැති බව නාඩි වාක්‍ය බලන්නා කීවේය. හොඳට තල්පත නැවත පරීක්ෂා කළ නාඩිගුරු 'ඉඳල හිටල එහෙමත් වෙනව. මේව ලියන්නෙ ඉසිරිසින්නාන්සේලා වුවත් ඒ අයත් මිනිස්සුනෙ. හරි එහෙනං මහත්තය යන්න දෙවි පිහිටයි. '' අහිත පිටවන්නට සැරසෙත්ම දොර අසල සිට සියල්ල අසා සිටි ආනන්දත් රෝහිතත් ඇතුළට ආවේය. 'අපිට ඔක්කොම තේරුණා. ' මේ පුතාට ජාතික හැඳුනුම්පතක් නැහැ. එහෙම ඒව ඕගොල්ලන්ට කියන්න බැහැ නේද? මොකක්ද ඕගොල්ල රජයේ කාර්යාලත් අල්ලගෙන කරන මගඩිය.. ආනන්ද උස් හඬින් සැරෙන් කීවේය. . මොනවද මුන්නැ හෙල කියන්නේ මේ වටිනා ශාස්ත්‍රයට නිගරු කරල දෙවියන්ගෙන් දඬුවම් විඳින්න එපා... එවර නාඩි ගුරු සැරෙන් කීවේය. 'අපේ කණ්ඩායමක් මේකෙ අලගිය තැන් මුලගියතැන් හොයනව එතකොට තමුන්ට තමයි දඬුවම් විඳින්න වෙන්නේ... ආනන්ද යළිත් සැරෙන් කීවේය. ඉන් හික්මුණු නාඩිගුරා 'හරි හරි මහත්තයල එන්නකො එන්නකො. යැයි කියමින් කට්ටිය සාලයට කැඳවා ගෙන ගොස් 'මෙහෙන් වාඩි වෙන්නකො මහත්තයල. මහත්තය අපි ලොකු සේවකයක්නෙ මිනිස්සුන්ට කරන්නෙ. යැයි කීවේය. 'සේවයක් මිනිහෙක් ගෙන්ම විස්තර අහගෙන ඉතුරු ටික ආණ්ඩුවේ කන්තෝරුවලින් අරගෙන රුපියල් හයදාහක් කඩා ගන්න එකද සේවය, මරු සේවය ''ආනන්ද කියත්ම 'පොඩ්ඩක් ඉන්න මහත්තය පොඩ්ඩක් ඉන්න.. යැයි කියමින් කාමරයකට ගිය නාඩි ගුරා තිදෙනාගෙන් ගත් රුපියල් හය දහසේ මුදල් තුන්දෙනාට ආපසු දුන්නේය. ''දැන් හරිනෙ මහත්තය එහෙනං දෙවි පිහිටයි යන්න... යැයි කීය. ''යන්න, යන්න එතකොට අපි රස්තියාදු වෙච්ච ''ආනන්ද අනුකම්පා විරහිතව කිවේය. .ආ.. මට තේරෙනව මට තේරෙනව පොඩ්ඩක් ඉන්න. ලෙස කියමින් යළිත් කාමරය වෙත දිව ගිය නාඩි ගුරා ඒ වතාවේ එක් අයකුට රුපියල් පනස් දහස ගණනේ බෙදන්නට සැරසෙත්ම 'ආ. ඒ සැරේ අපිව පගා ගහල අල්ලන්නද හදන්නෙ ඒව නම් බැරි වෙයි. අපි යමු යන්න. කට්ටියම ආපසු ආවේය. පාරේ එන ගමන් 'අපරාදෙ අංකල් අර සල්ලි අපිට ගන්නයි තිබුණේ. අහිත පවසත්ම '' මොකටද පුතේ ඔය අනුන්ගෙන් කොල්ලකාපු සල්ලි අපට.. යැයි ආනන්ද කීවේය. රෝහිත තම පුතු දෙස නුරුස්නා බැල්මක් හෙළීය. ඒත් මට පුදුමෙ අර කේන්ද්‍රරේ විස්තරය එවෙලේ අපෙන් වෙලාව අහගෙන කියපු එකනෙ. ඕව ගොඩක් ගණන් හදල එහෙම නැත්නං සොෆ්ට් වෙයාර් වලින් කරන වැඩනෙ. මිනිහ මනෝමයෙන් කිව්වේ ''රෝහිත කීවේය. 'අයියෝ ඕක සුළු දෙයක්නෙ අයිය ඉපදුන වෙලාව කීයද? උපන් දිනේ කවද්ද?.. ආනන්ද ඇසීය. ''මං ඉපදුණේ 1973 මැයි 17 උදේ 6.15 ට... රෝහිත තම කේන්ද්‍රරය බලා කීවේය. ''අපෝ හරි ලේසියි'' අවුරුද්දෙ අප්‍රේල් 13 ඉර මීන රාශියෙ ඉඳල මේෂ රාශියට එනව. එතකොට මැයි 14 න් පස්සෙ ඉන්නෙ වෘෂභ රාශියෙ. එතකොට ඉපදුනෙ 6/15 හින්ද ඉර තියෙන රාශියම තමයි ක්ෂිතිජයේ ගැටිල තියෙන්නෙ ඒක නිසා ලග්නෙ වෘෂභ හරිද?.. ආනන්ද කියද්දී රෝහිත මවිතයෙන් 'හරිනෙ. යැයි කිය. ''එතකොට ඉර ඒ කියන්නේ රවි ඉන්නෙත් මුදුනෙ කොටුවෙ ඒ කියන්නෙ එකේ හරි?. ''උඹ නම් නියම වැඩ්ඩෙක් හරි ඉතුරුවත් කියපන්.. රෝහිත කීය. එතකොට හෙණහුරා පහුගිය මාසෙ 28 තමයි ධනුවට මාරු වුණේ. සෙනසුරුට ඉර වටා යන්න අවුරුදු 30 ක් යනව. ඒ කියන්නෙ එක රාශියක ඉන්නෙ අවුරුදු දෙක හමාරයි. ඒ කියන්නේ මීට අවුරුදු 30 කට කලින් සැප්තැම්බර් අග ඒ කියන්නෙ 1988 සැප්. අග ඉඳල තියෙන්නෙ ධනුවෙ. අයියට දැන් 45 යිනේ. ඒ කියන්නේ තව 15 ක් ආපස්සට යන්න ඕන. ඒ කියන්නෙ රාශි 12 න් 6 ක් එතකොට සෙනසුරු ණී ශනි ඉන්න ඕන මිථුනෙ. එක කොටුවෙ ලග්නෙ වෘෂභ එතැන ඉඳල හයක් ආපස්සට ඒ කියන්නෙ හතේ ශනි. ආනන්ද මනා විග්‍රහයක් කළේය. 'ඒකත් හරිනෙ බං මං දැනං හිටියෙ නෑ උඹ ඔච්චර වැඩ්ඩෙක් බව. රෝහිත හිනාවෙමින් කියද්දී අහිත ආනන්දගේ අත අල්ලා ගත්තේය. 'ඉතුරු ටිකත් කියන්නද?. ආනන්ද අසත්ව 'නැහැ ඒව පස්සෙ බලමු දැන් ඉක්මනට යං. මිතුරෝ ආපසු පැමිණියහ.

චිත්‍රාන් මොරකන්දෙ ගමගේ